# 13

# මස්ජිද්

මුස්ලිම්වරුන්ගේ ජීවිතයත් සමඟ දෛනික ව බැඳී වෙලී පවතින ස්ථානය මස්ජිදය වේ. එය දයාවෙන් පිරි ස්ථානයකි; නිහඬතාව හා භක්තිය පිරී ඉතිරෙන ස්ථානයකි; මලාඉකාවරුන් වඩින ස්ථානයකි. එබැවින් මුස්ලිම්වරයකු හැඟීම්බර, ප්‍රබල සම්බන්ධතාවක් මෙයත් සමඟ පවත්වා ගත යුතු ය. එය ඊමානය විදහා දක්වන සංකේතයකි. පරලොව දී විමුක්තිය ලැබෙන මාර්ගයකි.

"කවරෙකුගේ සිත මස්ජිදය හා සමීප ව බැඳී පවතින්නේ ද ඔහු පරලොවෙහි අර්ෂයේ සෙවණෙහි සිටියි." (බුහාරි)

අල්ලාහ්ගේ මාර්ගයේ යාමට උපයෝගී වන දේව මැදුර "මස්ජිද්" යන පදයෙන් හැඟ වේ. මෙහි ඍජු අර්ථය සුජූද් කරන ස්ථානය නම් වේ.

**"නියත වශයෙන් ම මස්ජිද් සියල්ල අල්ලාහ් නැමදීම සඳහා ඇත."** (72 : 18)

අල්ලාහ් මස්ජිද්වල තත්ත්වය උසස් කොට ගරුකර එය තමාට ම හිමි වූවක් බව පවසමින් මෙලොව තමාට ඉතා ප්‍රියමනාප ස්ථානය මස්ජිද් යැයි වර්ණනාත්මක ව පැවසීමෙන් එහි විශේෂත්වය මැනවින් පෙන්නුම් කෙරේ.

මෙවන් විශේෂතාවලින් සපිරි දේව නිවාසවල පූජනීයත්වය රැකගැනීම ද එයට හිමි ගෞරවය පිරිනැමීම ද, එය රැක ගැනීම ද, අප සතු යුතුකමකි.

ඒ අනුව මස්ජිදයන් තුළ රැකිය යුතු විනය පිළිබඳව ඉස්ලාම් දහම අපට උගන්වා දී ඇත. ඒවා **"ආදබුල් මස්ජිද්"** යනුවෙන් හැඳින්වේ.



## 1. නැමදුම් ඉටු කරන ස්ථානයකි

අප අල්ලාහ් වෙනුවෙන් නැමදුම් වතාවත් ඉටු කරන පූජනීය ස්ථානය මස්ජිද් වේ. සලාත් ඉටු කිරීම, අල්ලාහ් සිහි කිරීම, අල්කුර්ආන් පාරායනය කිරීම ආදිය එහි ඉටු කළ යුතු ඉතා වැදගත් ඉබාදත් වේ.

**"එම නිවාසවල අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් පැවසීමට ද, එයට ගරු කිරීමට ද අණ කර ඇත." (24 :36)**

"නියත වශයෙන් ම මස්ජිදයන් අල්ලාහ් දික්ර් (මෙනෙහි) කිරීමට ද, සලාත් කිරීමට ද, අල්කුර්ආනය පාරායනය කිරීමට ද නියමිත ස්ථානයන් වේ." (මුස්ලිම්) යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසා ඇත.



## 2. තහියියතුල් මස්ජිද් සලාතය ඉටු කිරීම

ඉස්ලාම් දහමේ කිසි දු ස්ථානයකට නොදුන් වැදගත්කමක් ද පූජනීය බවක් ද මස්ජිද්වලට ලබා දී ඇත. එබැවින් මස්ජිදයකට පිවිසෙන කෙනෙකු පඬුරක් ලෙස රකඅත් දෙකක සලාතයක් ඉටු කළ යුතු බවට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අණ කළහ.

"ඔබෙන් කෙනෙකු මස්ජිදයට පිවිසි විට රකඅත් දෙකක සලාතයන් ඉටු නොකර එහි වාඩි නොවන්න." (බුහාරි)

සිකුරාද දිනයක නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ජුමුආ දේශනාව පවත්වන අවස්ථාවේ දී, මස්ජිදයට පිවිස වාඩි වූ සුලෛකා අල් අද්බානි නම් සහාබිවරයා දෙස බලා "රකාඅත් දෙකක් ඉටු කර වාඩි වන්න," යැයි අණ කළහ. එබැවින් මස්ජිදයට ඇතුළු වන කෙනෙකු රකඅත් දෙකක සලාතයක් ඉටු කිරීම සුන්නත් වූ ක්‍රියාවකි. මෙය "තහියියතුල් මස්ජිද්" (මස්ජිදය සඳහා වන පඬුර) සලාතය වේ.

මෙය මස්ජිදයට ම හිමි විශේෂත්වයකි. එහෙත් මස්ජිදුල් හරාම් මස්ජියට පිවිසෙන අය මෙම සලාතය වෙනුවට තවාෆ් ඉටු කිරීම එයට හිමි තහියියතුල් මස්ජිද් වේ.

### 3. පිරිසිදුකම රැකීම

මස්ජිදයට ඇතුළු වන කෙනෙකුගේ ඇඳුම පිරිසිදු ව තිබිය යුතු ය. නජීස් වූ සිරුරකින් හෝ ඇඳුමකින් හෝ ඇතුළු වීම ඉස්ලාම් දහම වළක්වා ඇත.

"ආදම්ගේ දරුවනි! සියලු නැමදුම් ස්ථානයන්හි ම ඇඳුමින් තොපව අලංකාර කර ගනිවු." (7: 31) යනුවෙන් අල් කුර්ආනයේ සඳහන් වේ.

සැම විට ම සුදු වර්ණ ඇඳුම් ඇඳීම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අගය කර ඇත.

"ඔබ සුදු වර්ණ ඇඳුම් අඳින්න. මන්ද යත් එය ඔබගේ ඇඳුම් අතරින් උසස් ම ඇඳුම් වේ. තව ද, ඔබ අතර මිය ගිය අය ද එමගින් ම කෆන් කරන්න." (අබූදාවූද්)

### 4. මස්ජිදයට ඇතුළු වන විට හා පිටත් වන විට ප්‍රාර්ථනා කිරීම

ඔබ අතරින් ඕනෑ ම කෙනෙකු මස්ජිදයට පැමිණියේ නම් ඔහු ප්‍රථමයෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් කෙරෙහි සලවාත් පැවසිය යුතු ය. පසුව දකුණු පාදය මුල් කොට තබා,

اَللّٰهُمَّ افْتَحْ لِي أَبْوَابَ رَحْمَتِكَ

"දෙවියනි, මා හට ඔබගේ කරුණා දෙරටුව විවර කර දෙනු මැන." යැයි ප්‍රාර්ථනා කළ යුතු ය. (මුස්ලිම්)

මස්ජිදයෙන් සිට පිටත් වන විට ප්‍රථමයෙන් වම් පාදය තබා,

اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ مِنْ فَضْلِكَ

"දෙවියනි, මම ඔබගේ කරුණාව ඔබගෙන් ඉල්ලා සිටින්නෙමි" යැයි ප්‍රාර්ථනා කළ යුතු ය. (මුස්ලිම්)

### 6. මස්ජිදයේ නිශ්ශබ්දතාව රැකීම

මස්ජිදයන් දේව මාලිගාවන් ය. එබැවින් එහි නිශ්ශබ්ද ව ද, යටහත් ව ද හැසිරිය යුතු අතර එහි ගෞරවය රැකීම ද මුස්ලිම්වරුන්ගේ යුතුකමකි.

වරක් මස්ජිදුල් නබවියේ මිනිසුන් දෙදෙනකු කතා කරමින් සිටිනු උමර් රළියල්ලාහු අන්හු තුමා දුටුවේ ය. ඔවුන් දෙදෙනා තමා වෙතට කැඳවාගෙන එන ලෙස එතුමා පැවසුවේ ය.

ඔවුන් පැමිණි විට "ඔබ දෙදෙනා පැමිණියේ කොහි සිට දැයි" විමසුවේ ය. එයට ඔවුහු "අප තායිෆ් ප්‍රදේශයට අයත් වූවන්" යැයි පැවසූහ. එවිට උමර් රළියල්ලාහු අන්හු තුමා "ඔබ මදීනාවාසීන් වන්නහු නම් අල්ලාහ්ගේ දූතයාණන්ගේ මස්ජිදය වූ මෙම මස්ජිදුල්

නබවියෙහි උස් හඬින් කතා කළ ඔබ දෙදෙනාට ම දඬුවම් පමුණුවාලන්නෙමි" යැයි පැවසුවේ ය.

එබැවින් මස්ජිද්වල උස් හඬින් කතා කිරීම, අන් අයට බාධා වන අයුරින් ශබ්ද නගා අල්කුර්ආනය පාරායනය කිරීම, සලාත් කරන්නන්ට ඉදිරියෙන් හරහට යාම, වාඩි වී සිටින අය ඇත් කර උරහිසට ඉහළින් පසු කර යාම, වෙළෙඳාම් කිරීම, අස්ථානගත වූ දේ පිළිබඳව නිවේදනය කිරීම ආදිය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ වැළැක්වූහ.

## 5. මස්ජිදය පිරිසිදු ව ද, අලංකාර ව ද, පිළිවෙළට ද තබා ගැනීම

මස්ජිදය අතු ගෑම, පිරිසිදු ව තබා ගැනීම, මස්ජිදයේ අපද්‍රව්‍ය බැහැර කිරීම, සුවඳ විහිදීමට සැලැස්වීම ආදිය ස්වර්ගයට කැඳවාගෙන යන මාර්ග වේ. (ඉබ්නු මාජාහ්)

"මස්ජිදය පිරිසිදු ව තබා ගැනීම හූරුල්ඊන්වරියන්ට හිමි මහර් වේ." (තබරානි)

ඉස්ලාමයේ සංකේතාත්මක ලාංඡනය ද, මුස්ලිම්වරුන් අතර ප්‍රධානස්ථානය ද වන මස්ජිදය අලංකාර ව, පිරිසිදු ව හා පිළිවෙළට තබා ගැනීම ද, එහි සුවඳ විහිදීමට සැලැස්වීම සඳහා ද සැම දෙනා දයක වීම උසස් වූ යහ ක්‍රියාවකි.



## 7. මස්ජිද් සමඟ සමීප සම්බන්ධතාවක් රැකීම

මුස්ලිම්වරයකු සැම විට මස්ජිදය සමඟ සමීප සම්බන්ධතාවක් රැකීම ද, එහි සේවාවල මුළු හදවතින් ම නිරත වීම ද, ඒ වෙනුවෙන් ඉපැයීම ද කැපවීම ද, අත්‍යවශ්‍ය ය.

මුස්ලිම්වරයකු මස්ජිදයේ සලාතයක් ඉටු කර පසු ව ඊළඟ සලාතය තෙක් එහි රැඳී සිටියේ නම් ඔහු එහි සිට පිට ව යන තුරු මලාඉකාවරු "දෙවියනි, මෙම මිනිසාගේ පාපයන් කමා කරනු මැන, ඔහු වෙත කරුණාව දක්වනු මැන." යැයි ප්‍රාර්ථනා කරති. (මුස්ලිම්)

**මස්ජිදයේ මහිමය වටහා ගෙන ඒවා පිරිසිදුව තබා ගනිමු. එයට හිමි විනය රැක ගනිමු. එහි ගරුත්වය ඉහළ නැංවීමට එක්ව වෙහෙස වෙමු.**

## අභ්‍යාස

1. මස්ජිදයෙහි විශේෂතා මොනවා ද?
2. මස්ජිදය සමඟ පවතින සම්බන්ධතාව ප්‍රබල කළ හැකි ක්‍රියා පහක් ලියන්න.
3. මස්ජිදයෙහි රැකිය යුතු විනය ලියන්න.
4. මස්ජිදය අලංකාර ව ද, පිරිසිදු ව ද තබා ගැනීමෙන් හිමි වන යහපත කුමක් ද?

## ක්‍රියාකාරකම්

ඔබගේ ගුරුතුමාගේ සහාය ඇති ව, ඔබ පාසලට ආසන්නයේ ඇති මස්ජිදයක් ශ්‍රමදානයක් මගින් පිරිසිදු කරන්න.